# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව

**දිනය** : 2013-11-26

**වේලාව** : පෙ.ව. 10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. | නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | ගරු නගර සභා මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | ගරු නගර සභා මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 6. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | නගර සභා ගරු මන්ත්‍රී | අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා |
| 8. | නගර සභා ගරු මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 9. | ගරු නගර සභා මන්ත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු සභාපතිතුමන් විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු නගර සභා මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ මාධ්‍යවේදීන් ඇතුළු සියළුම දෙනා ගරු සභාපතිතුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

2014 වර්ෂය සඳහා නගර සභාවේ පවත්නා වෙළඳසැල් හා සේවාවන් ගියවර සභාවේ තීරණය අනුව ටෙන්ඩර් කළ බවත්, ඒ අනුව අංක 12 මාළු කඩය හැර අන් සියළු කඩ, එළුමස් කඩය හැර අන් සියළු කඩ පසුගිය වර්ෂයේ ලංසු මුදල ඉක්මවවූ බව සඳහන් කරන ලදී. මේ ආකාරයට ලංසු කර සේවාවන් ලබා ගන්නවා මෙන්ම 2014 වර්ෂයේ අයවැය සඳහා මෙයින් ලැබෙන ආදායම ගණනය කිරීමට නියමිත බව ගරු සභාපතිතුමන් සඳහන් කරන ලදී.

අද දිනය විශේෂ දිනයක් වන්නේ, අපගේ රටට නායකත්වය දෙනවා මෙන්ම පොදුරාජ්‍ය මණ්ඩල සමුළුවක් පැවැත්වූ බව ද, විපක්ෂය විසින් කවරාකාර ප්‍රකාශ සිදුකළ ද, වසර 30ක කුරිරු යුද්ධය නිමා කර රට සංවර්ධනය කරන මොහොතක පැවැත්වූ මෙම සමුළුව ඉතා වැදගත් බව ද, අතිගරු

ජනාධිපතිතුමන් ජනතාවට අතිශයින්ම වැදගත් අයවැයක් ඉදිරිපත් කර ඇති බව ද, ඒ සඳහා බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමන්, උප සභාපතිතුමන් ඇතුළු නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රශංසාව එයට හිමි වන බව එතුමන් සඳහන් කරන ලදී.

මෙම අයවැයෙන් පළාත් පාලන ආයතන වලට මුදල් ප්‍රමාණයක් වෙන් කර ඇති බව ද, පළාත් පාලන ආයතන වලින් ජනතාවට සේවය කිරීම සඳහා එය පිටුවහලක් බව ද, අපට ලැබෙන ආදායම අඩුවීමක් සිදු වුවත් අතිගරු ජනාධිපතිතුමන් සමඟ සාකච්ඡා කිරීමෙන් එසේ අහිමි වන ආදායම ලබා ගැනීමට හැකි බව ද එතුමන් සඳහන් කරන ලදී.

'එක ගමකට එක් වැඩක්' වැඩසටහන යටතේ නගර සභා ගරු මන්ත්‍රීතුමන් විසින් ගොඩනැංවීම ආරම්භ කරන ලද ළමා උද්‍යානයේ කටයුතු මේ වන විට අවසන් වෙමින් පවතින බව ද, ඒ හේතුවෙන් නගරයේ මුඩුක්කු බවට පත් වී තිබූ අනවසර වෙළඳසැල් කිහිපයක් ඉවත් කර ගැනීමට හැකි වූ බව ද, තමන් කුඩා කාලයේ දුටු ආකාරයේ සුන්දර පරිසරයක් නැවත බළන්ගොඩ නගරයේ ඇති වී ඇති බව ද ගරු සභාපතිතුමන් සඳහන් කරන ලදී. මේ වැඩසටහනට වෙන් වූයේ රුපියල් ලක්ෂ 10ක මුදලක් වුවත් මේ වන විට එය රුපියල් ලක්ෂ 30ක පමණ නිමාවකින් යුතු බව ද, එම මුදලට වඩා එම ක්‍රියාවලිය වැදගත් බවත්, නගර සභා ගරු මන්ත්‍රීතුමන් වෙත භාරදුන් පුස්තකාලය මේ වන විට ශ්‍රී ලංකාවේ තෙවන ස්ථානයට පත් වී ඇති බවත්, එතුමන්ගේ අධිෂ්ඨානය අගය කරන බවත් ගරු සභාපතිතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපතිතුමන් කෙළින් කතා කිරීම සහ වැරදි පෙන්වා දීම වැදගත් බව ද, එතුමන්ගේ සංකල්පය නිවැරදි බව ද, එතුමන් මස් විකුණනවාට හා ආහාරයට ගන්නවාට නොව සතුන් මරණ ස්ථානය සම්බන්ධයෙන් විරෝධතාවය දක්වන බව ද ගරු සභාපතිතුමන් සඳහන් කරන ලදී. ආහාර බලධාරියා වශයෙන් තමන්ට පනත් මගින් පැවරී ඇති වගකීම අනුව තමන් මස් කඩය සඳහා ලංසු කැඳවූ බව ද, මස් සඳහා ගවයන් මරණ ස්ථානයට අදාලව මාස 06ක ඇපයක් ගැනීම කළ යුතු බව ද, මාස 03ක කුලිය ලබා ගැනීම කළ යුතු බව ද, ලිඛිතව දන්වන හේතුවක් මත හෝ එසේ වසා තැබීම නියම කරනු ලබන විශේෂ නිවාඩු දිනයන්හි හැරුණු කොට නගර සභාවෙන් ලංසු පදනම මත ලබා ගන්නා කිසිදු වෙළඳසැලක් දින තුනකට වඩා වසා තැබීම නොකළ යුතු බවට ද, ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

2014 වර්ෂයේ දී විශාල සංවර්ධනයක් බළන්ගොඩ නගරයට ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමන් සඳහන් කරන ලදී. මේ සභාව තුළ කතා කළ යුත්තේ අප හට නගරයට ලබා දීමට හැකි සංවර්ධනය හා පනත් වලින් නගර සභාවට පැවරී ඇති කාර්යයන් සම්බන්ධව පමණක් බව එතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

''පසුගිය මහා සභාවේ දී ඌරු මස් කඩය සම්බන්ධයෙන් සාකච්ඡාවට ලක් කෙරුනේ න්‍යාය පත්‍රයට බාහිරව වන බැවින්, එය සභාවාර්තාවට ඇතුලත් නොවිය යුත්තක් බව **ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.**''

යනුවෙන් පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනයට අදාලව ඇතුළත් වූ වාක්‍යයෙහි ගරු **''සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී''** වෙනුවට **''නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී**'' යනුවෙන් නිවැරදි විය යුතු බවට නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කි රීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 ගිනි නිවීමේ ඒකකයේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම

ගිනි නිවීමේ ඒකකයක් පවත්වාගෙන ගිය ද හදිසි අවස්තාවක දී එහි කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා අපහසුතාවලට මෙම නගර සභාවට මුහුණ දීමට සිදු වූ බවත්, පසුගිය දිනෙක බළන්ගොඩ නගරයේ ඇති වූ ගින්න පාලනය කිරීමට යාමේ දී ජල බවුසරයක් නොමැතිකම, තිබෙන ජල බවුසරය කඩිනමින් එම ස්ථානයට ළඟා නොවීම, ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොසිටීම හා ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීමේ දී ද ගැටලු රැසක් ඇති වූ බවත් ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී. එවන් තත්ත්වයක් ඇති වීම වැලැක්වීමට පහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී.

1. නගරයේ ඇති සියළුම ව්‍යාපාරික ස්ථානයන්හි සේවය කරන අය අතරින්, එක් ව්‍යාපාරික ස්ථානයකින් දෙදෙනෙකු බැගින් ගෙන ගිනි නිවීම පිළිබඳ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීමේ ඒකකයේ සහයෙන් එක් කණ්ඩායමකට 60 දෙනෙකු බැගින් 120 දෙනෙකු පුහුණු කිරීම.
2. සියළු ව්‍යාපාරික ස්ථාන වලට ලීටර් 2,000ක වතුර ටැංකියක් සමඟ ගිනි නිවන යන්ත්‍රයට හදිසි අවස්ථාවක දී ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි නල පද්ධතියක් සවි කිරීම සඳහා එය සකස් කරන ලෙස දන්වා නිවේදනයක් යැවීම.
3. ඉහත දැනුවත් කිරීමේ වැඩසටහන් දෙක සඳහා සම්පත්දායක දීමනා ලෙස කොළඹ ගිනි නිව ඒකකයේ නිලධාරියාට දින දෙදකට රු. 20,000.00ක් ගෙවා, ප්‍රවාහන පහසුකම් සැපයීම. සම්පූර්ණ වැඩසටහන් දෙක සඳහා දිවා ආහාර, කෙටි ආහාර සමඟ එකසිය විසි (120) දෙනෙකු සඳහා රු. 100,000.00ක් පමණ වැය වන හෙයින් එක් ආයතනයකින් රු. 1000.00 බැගින් එකතු කිරීම.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:02 නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා ආදේශක වෛද්‍යවරයකු ලබා ගැනීම

මෙම සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවෙහි ආයුර්වේද වෛද්‍යවරිය හා ඖෂධ සංයෝජකවරිය නිවාඩු ගන්නා අවස්ථාවල දී සේවය කිරීම සඳහා ආදේශක වෛද්‍ය නිලධාරියකු හා ඖෂධ සංයෝජකවරයකු යෙදවීමටත්, ඒ සඳහා සභා අරමුදලින් දෛනික දීමනාවක් ගෙවීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒකමතිකව සම්මත විය.

### 06:03 හදිසි ගින්න නිවීම සම්බන්ධව ස්තූතිය පළ කිරීම - බළන්ගොඩ වෙළඳ සංගමය

බළන්ගොඩ නගරයේ හදිසියේ ඇති වූ ගින්න නිවීම සම්බන්ධයෙන් මෙම සභාවට ස්තූතිය පළ කරමින් බළන්ගොඩ වෙළඳ සංගමය විසින් එවා ඇති ලිපිය මහා සභාවේ දැන ගැනීම පිණිස ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී.

### 06:04 හදිසි ගින්න නිවීම සම්බන්ධව ස්තූතිය පළ කිරීම - විදුහල්පති, ර/ඇල්ලෙපොල මහා විද්‍යාලය

බළන්ගොඩ නගරයේ හදිසියේ ඇති වූ ගින්න නිවීම සම්බන්ධයෙන් මෙම සභාවට ස්තූතිය පළ කරමින් ර/ඇල්ලෙපොල මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවා ඇති ලිපිය මහා සභාවේ දැන ගැනීම පිණිස ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී.

**06:05 2013 අධ්‍යාපන චාරිකාව සඳහා වාහන පහසුකම් සපයා ගැනීම - මොහාන් එල්ලාවල සමාජ සංවර්ධන පදනම**

හිටපු ගරු ආණ්ඩුකාරවර මොහාන් සාලිය එල්ලාවල මැතිතුමන්ගේ 65 වන ජන්ම දිනය වෙනුවෙන් පැවැත්වූ පාසැල් විවාද තරගාවලියෙන් ජයග්‍රහණය කළ කණ්ඩායම් දෙකට එක් දින අධ්‍යාපන චාරිකාවක් සඳහා මෙම සභාවෙන් 2013.12.26 හා 28 දෙදින වෙන්කර දෙන මෙන් මොහාන් එල්ලාවල සමාජ සංවර්ධන පදනමෙන් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 බලපත්‍ර ලත් ව්‍යාපාර වෙනුවට වෙනත් ව්‍යාපාර පවත්වාගෙන යන ව්‍යාපාරිකයන්ට නඩු පැවරීම**

2013 වර්ෂයට මේ දක්වා වලංගු බලපත්‍ර ලබාගත යුතු, එහෙත් ලබානොගත් ව්‍යාපාර හා බලපත්‍රය මගින් බලය ලබා දී ඇති ව්‍යාපාරය වෙනුවට වෙනත් ව්‍යාපාර පවත්වාගෙනයන ව්‍යාපාරිකයන් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**16:07 බලන්ගොඩ නගර සභාවේ ගෝඝාතකාගාරය සම්බන්ධ පැහැදිලි කිරීම**

බලන්ගොඩ නගර සභාවේ ගෝ ඝාතකාගාරය සම්බන්ධව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් සිදු කරන ලද පැහැදිලි කිරීම ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**06:08 අනතුරුදායක නාය යාම - ආර්. ආනන්ද කුමාර් මයා**

බලන්ගොඩ, තුඹගොඩ, බැංකියවත්ත, චෙට්නෝල් පාර, එල්/36 හි පිහිටි තම නිවස අසළ නාය යාමේ අවදානමක් පවතින බව එහි පදිංචි ආර්. ආනන්ද කුමාර් යන අය විසින් දන්වා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, ඒ සම්බන්ධව පරීක්ෂාකර බලා අවශ්‍ය කටයුතු සිදු කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර මේ සම්බන්ධව වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 මාර්ග සංවර්ධන කර්මාන්ත සඳහා කොටස් මුදල් ලබා ගැනීම - එම්. ඒ. නිහාල් ජයරත්න මයා**

කිරිඳිගල ශෛලතලාරාම පිවිසුම් මාර්ගය අන්තර් සම්බන්ධතා ගල් ඇතිරීම, ශෛලතලාරාම පළමු පටුමග සංවර්ධනය කිරීම, හා මුගුණමලේ බණ්ඩාරවත්ත මාර්ගය සංවර්ධනය කිරීම යන කර්මාන්තයන්හි අත්තිකාරම් මුදල් ලබා දෙන ලෙස කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 3701/එල් නඩුව - සිතාසිය**

බළන්ගොඩ දිසා අධිකරණයේ විභාග වන 3701/එල් නඩුවට අදාලව එවා ඇති ලිපිලේඛන ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, මේ සඳහා ගෙවන ලද නඩු ගාස්තු ඉල්ලා යැවීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව ස්ථිර විය.

**06:11 වැඩ අවසන් කළ කර්මාන්ත සඳහා කොටස් ගෙවීමක් ලබා ගැනීම**

වීරසුන්දරාරාම විහාරස්ථාන මාර්ගය සහ පොලිස් ක්‍රීඩාංගන ප්‍රවේශ මාර්ගය යන තමන් විසින් වැඩ අවසන් කරන ලද ව්‍යාපෘතීන් සඳහා අත්තිකාරම් මුදල් ලබා දෙන ලෙස තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් සඳහන් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:12 දෘෂ්‍යාබාධිතයන් සඳහා ආධාර ලබා ගැනීම - නෙත් සෙවන බහුකාර්ය ආයතනය**

ශ්‍රී ලංකා ජාතික දෘෂ්‍යාබාධිතවූවන්ගේ සම්මේලනය මගින් සබරගමුව පළාතේ දෂ්‍යාබාධිත ජනතාවට ස්වයංරැකියා කරගෙන යාම සඳහා ආරම්භ කර ඇති නෙත් සෙවන ආයතනය මගින් එහි නේවාසික පිරිසට ආහාර පාන සපයා ගැනීමට ආධාර ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම්දුන් අතර, මේ සඳහා මුදල් ප්‍රතිපාදන ඇතොත් යම් ආධාරයක් ලබා දීමට යෝජනා කරන ලදී

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:13 ශ්‍රී බෝධිමාලකාරාම විහාරස්ථානය ඉදිරිපිට මාර්ගය ඉවුර හැරීම නිසා ගමන් කිරීමට අපහසු වීම - බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් සහ ඩබ්. පියදාස මයා**

අංක 453/3, උඩ ඇල්ලෙපොල, බළන්ගොඩ ලිපිනයේ පදිංචි ඩබ්. පියදාස යන අයගේ නිවසට පිවිසෙන ශ්‍රී බෝධිමාලකාරාම විහාරස්ථානය අසළින් පිහිටා ඇති මාර්ගය ජී. විපුලසේන පෙරේරා යන අයගේ නිවස අසළින් අනවශ්‍ය ලෙස ඉවුර හැරීම නිසා ගමන් කිරීම අපහසු බව බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, ඒ සමග ඩබ්. පියදාස යන අය විසින් ද එවා ඇති ලිපිය සලකා බලා ඒ සඳහා අවශ්‍ය කටයුතු කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:14 මාර්ග පුළුල් කිරීමට අදාලව ව්‍යාපාරිකයන් වෙත යවන නිවේදනය - බළන්ගොඩ වෙළඳ සංගමය**

බළන්ගොඩ නගරයේ මාර්ග පුළුල් කිරීමේ දී ඇතිවන ගැටළු වලට මුහුණ දීම සඳහා ව්‍යාපාරිකයන් දැනුවත් කිරීම සඳහා බළන්ගොඩ වෙළඳ සංගමය විසින් කටයුතු කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, ඒ සම්බන්ධව වෙළඳ සංගමය වෙත ස්තුතිය පළ කිරීමට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:15 නගර සභාවට බදු මුදල් නොගෙවන නිවැසියන් සම්බන්ධව සලකා බැලීම**

බළන්ගොඩ - දොරවෙල පාරේ පැරණි ගල්වල පිහිටි ඉඩම අක්කර 01, රූඩ් 01, පර්චස් 11ක් වන ප්‍රමාණය බළන්ගොඩ නගර සභාව සතු ඉඩමකි. මෙම ඉඩමේ ගල්වලට උඩින් පිහිටි කොටසේ පහත වරිපනම් අංක සහ නම් දරන අය පදිංචිව සිටින බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලදී.

29/1 - සුනිල් දයාරත්න
29/2 - දර්ශනී වර්දරාජ්
29/3 - ඩබ්. තෙයිමානි
29/4 - ලක්ෂ්මන් ප්‍රනාන්දු
29/5 - කමලා වීරසිංහ
29/6 - ජගත් විජයරත්න

එම අය වෙතින් කිසිදු බදු මුදලක් නගර සභාව විසින් අය නොකරන බව එතුමන් වැඩිදුරටත් සඳහන් කළ අතර, ඒ සම්බන්ධව ඔවුන් සමඟ 2013.11.26 වන දින සාකච්ඡා කිරීම සඳහා මහා සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:16 ආපදා කළමනාකරණයට පාසැල් සහ රෝහල් සුරක්ෂිත බව සම්බන්ධ වැඩමුලුව - ඉන්කොන්, දකුණු කොරියාව**

දකුණු කොරියාවේ ඉන්කොන්හි දී 2013 දෙසැම්බර් මස 10 වන දින සිට 13 වන දින දක්වා පැවැත්වෙන Regional Workshop: City-to-City Learning and Training on the Tool for the Assessment of School and Hospital safety for Multi-Hazards in South Asia සඳහා මෙම සභාවේ ගරු සභාපතිතුමන්ටත්, උප සභාපතිතුමන්ටත්, වැඩ අධිකාරී යූ. වී. දැල බණ්ඩාර මහතාටත්, මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. එන්. ප්‍රේමතිලක මහතාටත් ආරාධනා ලැබී ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලදී.

අදාල වැඩසටහන සඳහා ගරු සභාපතිතුමන්ට, වැඩ අධිකාරී යූ. වී. දැල බණ්ඩාර මහතාට සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. එන්. ප්‍රේමතිලක මහතාට ආපදා කළමනාකරණය සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලය වෙතින් ගුවන් ටිකට්පත් සහ අනෙකුකුත් වියදම් ලබා දෙන බව දැනුම් දුන් අතර, ගරු උප සභාපතිතුමන් ද එම වැඩමුළුව සඳහා තම පෞද්ගලික වියදමින් සහභාගී වන බව දැනුම් දෙන ලදී.

මෙම වැඩමුළුවට සහභාගී වන ගරු සභාපතිතුමන්ට, උප සභාපතිතුමන්ට, වැඩ අධිකාරී හා මහජන සෞඛ්‍ය පරීකෂක වෙත අදාල කාල සීමාව සඳහා නිවාඩු අනුමත කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:17 ගව ඝාතකාගාරය පාසැල අසලින් ඉවත් කර ගැනීම**

බළන්ගොඩ යශෝධරා අඳ ගොළු බිහිරි විද්‍යාලයේ විදුහල්පතිතුමන් විසින් මෙම සභාවට ද පිටපත් සහිතව අධ්‍යාපන, සංස්කෘතික කටයුතු හා තොරතුරු තාක්ෂණ ගරු අමාත්‍ය භාණු මුණිප්‍රිය මැතිතුමා වෙත, තම විදුහල අසළ පිහිටා ඇති ගව ඝාතකාගාරය හේතුවෙන් ඇති තිබෙන අපහසුතාවයන් දන්වමින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**06:18 කල්තොට මාර්ගය මංතීරු දෙකකට සකස් කිරීමේ දී ගත යුතු තීරණ**

කල්තොට මාර්ගය මංතීරු දෙකකට වෙන් කිරීමේ දී මධ්‍ය රේඛාවේ සිට එක් පසෙකට අඩි 26 බැගින් පදික වේදිකාව සහිතව අඩි 56ක් සංවර්ධනය කිරීමට එයට අදාල ස්ථානීය පරීක්ෂණයට පෙර පැවති සාකච්ඡාවේ දී සංවාදයට ලක් වූ බව ගරු සභාපතිතුමන් විසින් සඳහන් කරන ලද අතර, ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිරකරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:19 2014 වර්ෂය සඳහා සභාව සතු වාහන රක්ෂණය කිරීම**

මෙම සභාව සතු වාහන අතරින් ජේ. සී. බී. යන්ත්‍රය හැර අනෙකුත් සියළු වාහන වල රක්ෂණ කාල සීමාව 2013.12.25 වන දිනෙන් අවසන් වන බැවින්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් ලබා දෙන මිල ගණන් අනුව සියළු වාහන රක්ෂණය කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:20 2013 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු**

බළන්ගොඩ නගර සභාවේ ප්‍රධාන කාර්යාලය, පුස්තකාලය, ගබඩාව, පෙර පාසැල්, ආයුර්වේදය, තානායම, ක්‍රීඩාගාරය, කොම්පෝස්ට් ව්‍යාපෘතිය, ප්ලාස්ටික්/පොලිතින් ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානය, විදුනැණ පියස, සම්පත් පියස, ලේකම් නිල නිවස, ප්‍රජා ශාලා ඇතුළු සියළු අංශ වලට අදාලව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 ජනවාරි මාසය තුළ පවත්වා අවසන් කළ යුතු බැවින්, ඊට අදාල කටයුතු ඉටු කිරීම සඳහා පහත නම් සඳහන් ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා සහ නිලධාරීන් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයට පත් කර ගැනීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

සාමාජික නගර සභා ගරු මන්ත්‍රී මණ්ඩලය

1. ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
2. එම්. ටී. එම්. රූමි මැතිතුමා
3. අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා

නිලධාරී මණ්ඩලය

1. සභාපති අමිතා කරුණාරත්න මිය, ප්‍රධාන කළමනාකරණ සහකාර
2. සාමාජික අමිල මිහිරංග රසාංජන මයා, සංවර්ධන නිලධාරී
3. සාමාජික එම්. සෙල්වරාණි මිය, කළමනාකරණ සහකාර
4. සාමාජික ප්‍රීතිකා දිල්හානි මෙය, කළමනාකරණ සහකාර
5. සාමාජික කුමාර සෙනෙවිරත්න මයා, කළමනාකරණ සහකාර
6. සාමාජික ලලිත් සමරජීව මයා, සංවර්ධන නිලධාරී
7. සාමාජික ඉයන් ඩියුක් ඩැනියෙල් මයා, තානායම් භාරකරු
8. සාමාජික නදීකා කාන්තිරත්න මිය, සංවර්ධන නිලධාරී
9. මහජන පුස්තකාලයේ පොත් සමීක්ෂණය සඳහා පුස්තකාලයාධිපති සහ එහි කාර්ය මණ්ඩලය.

ඉහත යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**න්‍යාය පත්‍රය ගරු මන්ත්‍රීතුමන්ලා වෙත යැවීමෙන් පසු මහා සභාවට ඉදිරිපත් කරන ලද යෝජනා**

**06:21 2014 වසර අයවැය යෝජනා ඉදිරිපත් කිරීම - ගරු අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා - ප්‍රධාන ලේකම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය**

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සියළුම පළාත් පාලන ආයතන නියෝජිතයන් අදාල පළාත් පාලන ආයතනයන්හි අයවැය යෝජනා සම්මත කිරීමට ඡන්දය පාවිච්චි කළ යුතු බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මධ්‍යම කාරක සභාවේ තීරණය පරිදි දන්වමින් එම පක්ෂයේ ප්‍රධාන ලේකම් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින්

එවන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**06:22 බෙලිගල විහාර මාවත ප්‍රතිසංස්කරණය කිරීම**

ඇල්ලෙපොල විදුහල අසලින් බෙලිගල විහාරය දක්වා ඇති මාර්ගයේ බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයට අයත් ආරම්භක කොටස වාහන ගමනාගමනය කළ නොහැකි තරමට අබලන් වී ඇති බැවින් එය ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ඇල්ලෙපොල, වඩුකන්ද, දිරිය සුභසාධක සමිතිය ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය .

**06:23 කිරිඳිගල කලුවැල්ල කැලේ අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම - එල්. ඩී. වසන්ත පද්මසිරි මයා**

කිරිඳිගල කලුවැල්ල කැලේ මාර්ගයේ මීටර 80ක පමණ කොටසක් කොන්ක්‍රීට් කිරීමට ඉතිරිව ඇති බවත්, එම කොටස අධික බෑවුම් සහිත බැවින් ගමනාගමනය ඉතා දුෂ්කර වී ඇති බවත් දන්වමින් එල්. ඩී. වසන්ත පද්මසිරි යන අය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර, අදාල මාර්ගයේ තත්ත්වය පරීක්ෂාකර ඉදිරි කටයුතු සිදු කිරීමට මහා සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:24 කොටුගොඩැල්ල මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම**

බළන්ගොඩ කොටුගොඩැල්ල මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කර දෙන මෙන් ඉල්ලා එම ප්‍රදේශවාසීන් විසින් එවන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, පරීක්ෂාකර බලා ඉදිරි කටයුතු සිදු කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතික සම්මත විය.

**06:25 උඩ ඇල්ලෙපොල සෙනෙවිරත්න ස්ටෝර්ස් ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කිරීම - විජයලංකා කොඩිකාරගේ මයා**

බළන්ගොඩ, උඩ ඇල්ලෙපොල, සෙනෙවිරත්න ස්ටෝර්ස් ඉදිරිපිට වෙල්යාය මැදින් ඇති අඩි 3ක් පමණ පළල මාර්ගය, අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි අතුරු සකස් කර දෙන මෙන් විජයලංකා කොඩිකාරගේ යන අය සහ අනෙකුත් ප්‍රදේශවාසීන් විසින් සිදු කර ඇති ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කළ අතර, පරීක්ෂාකර බලා ඉදිරි කටයුතු සිදු කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:26 ඉම්පීරියල් ඉදිරිපිට කඩකාමර වල බදු මුදල වැඩි කිරීම**

ඉම්පීරියල් ඉදිරිපිට ඇති කඩකාමර සඳහා මෙතෙක් පදික බදු වශයෙන් රු. 517.00ක මුදලක් අය කරන ලද බවත්, අයවැය කමිටුවේ දී එය රු. 1,500.00 දක්වා වැඩි කිරීමට යෝජනා වූ බවත් ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලද අතර, එම යෝජනාව 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:27 ඇල්ලෙඅරාව නාමල් උයන පිවිසුම් මාර්ගය කොන්ක්‍රීට් කර සැකසීම - එම්. කේ. සී. සමරසිංහ මයා**

ඇල්ලෙඅරාව නාමල් උයන පිවිසුම් මාර්ගය වර්ෂාකාලයේ දී සේදී යාම හේතුවෙන් අබලන් වී ඇති බව දක්වා එම්. කේ. ඊ. සමරසිංහ යන අය සහ ප්‍රදේශවාසීන් විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, මේ සම්බන්ධව පරීක්ෂාකර බලා ඉදිරි කටයුතු සිදු කිරීමට යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ඉහත යෝජනාව ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:28 සෙවිලි තහඩු සහනාධාරයක් ලබා ගැනීම - ඩබ්. ඒ. ගුණපාල මයා**

තම නිවසේ වහලය දිරාපත් වී ඇතත් එය අලුත්වැඩියා කර ගැනීමට අසීරු බැවින් ඒ සඳහා සෙවිලි තහඩු ලබා දෙන මෙන් ඉල්ලා උඩ ඇල්ලෙපොල, සරස්වතීවත්ත, නො. 45 ස්ථානයේ පදිංචි ඩබ්. ඒ. ගුණපාල යන අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම්දුන් අතර, පරීක්ෂාකර බලා මෙම අවශ්‍යතාවය ඉටුකර දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:29 කිරිඳිගල 'තොසිල ගාර්ඩ්න්' ඉඩමේ කාණු පද්ධතිය සකස් නොකිරීමෙන් වන ගැටලු සාකච්ඡා කිරීම - එස්. නාරංගොඩ මයා**

බළන්ගොඩ, කිරිඳිගල 'තොසිල ගාර්ඩ්න්' ඉඩමේ කාණු පද්ධතිය සකස් නොකිරීම හේතුවෙන් ප්‍රදේශවාසීන්ට ඇතිවී තිබෙන අපහසුතාවයන් දන්වා එස්. නාරංගොඩ යන අය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, මේ සම්බන්ධව සලකා බැලීම සඳහා 2013.12.04 වන දින ප.ව. 2.00ට අදාල පාර්ශවයන් සම්බන්ධ කරගනිමින් සාකච්ඡාවක් පැවැත්වීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:30 වරිපනම් ගාස්තු අඩු කරගැනීම**

පෙට්ටිගල පාර, අංක 17/38 දරන නිවසේ වරිපනම් ගාස්තු දැරිය නොහැකි අයුරින් වැඩිකර ඇති බවට බෝම්බුව ප්‍රජාශාලාවේ දී පැවති වරිපනම් අය කිරීමේ ජංගම සේවයේ දී ඉදිරිපත් වූ බවත්, එම ස්ථානය පරීක්ෂා කළ පසු අදාල නිවැසියාට එම බදු මුදල ගෙවීම අපහසු බව දැකිය හැකි වූ බවත් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එහි වාර්ෂික වටිනාකම 50% කින් අඩුකර අය කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතික සම්මත විය.

**06:31 අංක සී - 51 කඩ කාමරය පවරා දීම - නීතිඥ අනෝමා ප්‍රනාන්දු මිය**

අංක සී 51 දරන කඩකාමරය කෝනාර මුදියන්සේලාගේ උමයංගනී ශර්මිලා කුමාරි යන අයට පවරා දෙන මෙන් දැනට එය පපවත්වාගෙන යනු ලබන අනෝමා ප්‍රනාන්දු යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර සභාවට අයවිය යුතු මුදල් අයකරගෙන එය සිදු කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:32 කඩ කාමරය වෙනත් අයකුට පැවරීම - බී. ඒ. කමලා මැණිකේ**

තමන් විසින් පවත්වාගෙන යනු ලබන බස් නැවතුම්පොල ඉදිරිපිට අංක 185/7 දරන කඩකාමරය බළන්ගොඩ, අංක 32/8-ඒ යන ස්ථානයේ පදිංචි එල් ජී. මංජුල ජයවීර ය නඅය හට පවරා දෙන මෙන් බී. ඒ. කමලා මැණිකේ ය නඅය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:33 බස් නැවතුම්පොල හිඟ මුදල් ඇති කඩකාමර පවරා ගැනීම**

බස් නැවතුම්පොල පහත දැක්වෙන කඩකාමර වල මාස තුනකට වඩා නොගෙවූ හිඟ මුදල් ඇති බැවින් පළමු කඩ කාමරය සඳහා මාස 02ක් වන දින තෙක් කල් ලබාදීමටත් අනෙකුත් කඩකාමර දෙසැම්බර් 10 වන දිනට පෙර සියළු හිඟ මුදල් නොගෙවූහොත් සීල් තබා නැවත සභාව වෙත පවරා ගැනීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

| | | | | |
|---|---|---|---|---|
| 1. | ඩිපෝ අධිකාරී, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | A-23 | රු. | 571,428.00 |
| 2. | ඩබ්. ජී. ජයසේකර මයා | C-42 | රු. | 57,106.00 |
| 3. | නාලක කටුපිටිය මයා | C-48 | රු. | 66,911.00 |
| 4. | නාලක කටුපිටිය මයා | C-49 | රු. | 66,911.00 |
| 5. | කේ. එම්. ස්ටින් සිල්වා මයා | D-09 | රු. | 55,340.00 |
| 6. | එල්. එස්. ගුණසේකර මයා | D-16 | රු. | 40,194.00 |
| 7. | යූ. පී. ගුණසේකර මයා | D-25 | රු. | 48,043.00 |
| | | **එකතුව** | **රු.** | **905,933.00** |

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:34 දුරගමන් සේවා බස්රථ අනවසර ස්ථානයක නැවැත්වීම - සාමාන්‍යාධිකාරී, සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

බදුල්ල සිට කොළඹ බලා ධාවනය වන බස්රථ බළන්ගොඩ පොලිස් ස්ථානය ඉදිරිපිට බොහෝ වේලාවක් නතර කර තබන බැවින් විකල්ප වශයෙන් වෙනත් ස්ථානයක් ලබා දෙන මෙන් සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලදී. මේ සම්බන්ධව මීට පෙර ද යෝජනා ස්ථිර වී ඇති බව සඳහන් කළ ගරු සභාපතිතුමන් අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කර එම තීරණ ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලදී.

එම යොජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

මුදල් කමිටුවේ සම්මත කරන ලදී.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

### 08:01 බලන්ගොඩ තානායම් පරිශ්‍රයෙහි ඉදිරිපිට ගිල්වන ලද කුස්තුර සහිත සක්ක බැම්ම බැඳීම කර්මාන්තය දෙවන අදියර

බලන්ගොඩ තානායම් පරිශ්‍රයෙහි ඉදිරිපිට ගිල්වන ලද කුස්තුර සහිත සක්ක බැම්ම බැඳීම කර්මාන්තය දෙවන අදියර සඳහා වන රු. 911,264.44ක ඇස්තමේන්තුව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ද, මෙම ව්‍යාපෘතියේ රු. 251,700.00ක් වන ද්‍රව්‍ය ඇස්තමේන්තුව පළාත් සභාව වෙතින් ලබා ගැනීමට හා ඉතිරිය සභා අරමුදලෙන් සිදු කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

### 09:01 බලන්ගොඩ මොහාන් සාලිය එල්ලාවල මාවත මධ්‍ය තීරය මල් සිටුවීම

බලන්ගොඩ මොහාන් සාලිය එල්ලාවල මාවත මධ්‍ය තීරය මල් සිටුවීම සඳහා කොන්ක්‍රීට් බඳුන් සෑදීමට අවශ්‍ය හැඩයම් සැපයීම සඳහා කැඳවන ලද මිල ගණන් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| කාරණය | ආයතනය | | |
|---|---|---|---|
| | ෆොන්සේකා වුඩ් වර්ක්ස්, නො. 28, කල්තොට පාර, බළන්ගොඩ | නිව් රෝයල් ටිම්බර්, නො. 25/27, බස් නැවතුම්පොල, බළන්ගොඩ | සිටි ටිම්බර් ස්පොට්, අංක 44, කල්තොට පාර, බළන්ගොඩ |
| කොන්ක්‍රීට් මල් බඳුන් ඉදිකිරීම සඳහා හැඩයම් අමුණා ඇති සැලසුම් හා උපදෙස් පරිදි ඉදිරිපත් කර සැපයීම. | අඩි 2 x 2 ස්රේම් යොදා ඇල්බීසියා ලෑලි ආවරණය කර මල් පෝච්චි අච්චු 01 සෑදීම සඳහා<br>රු. 12,500.00 | රු. 12,850.00 | රු. 13,250.00 |

ඉහත මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතනයන් අතරින් රු. 12,500.00ක් වන අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති බළන්ගොඩ, කල්තොට පාර, නො. 28 දරන ස්ථානයේ පිහි ෆොන්සේකා වුඩ් වර්ක්ස් ආයතනයේ මිල ගණන් පිළිගැනීමටත්, එම ආයතනයෙන් අදාල සේවාව ඉටු කර ගැනීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 09:02 බලන්ගොඩ මොහාන් සාලිය එල්ලාවල මාවත මධ්‍ය තීරය මල් සිටුවීම පිණිස කොන්ක්‍රීට් බඳුන් ඉදිකිරීම් වැරගැන්නු සඳහා ශක්තිකරණ පාස්සා සැපයීම

බලන්ගොඩ මොහාන් සාලිය එල්ලාවල මාවත මධ්‍ය තීරය මල් සිටුවීම පිණිස කොන්ක්‍රීට් බඳුන් ඉදිකිරීම් වැරගැන්නු සඳහා ශක්තිකරණ පාස්සා සැපයීම - බඳුන් 100ක් සඳහා කැඳවන ලද මිල ගණන් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| කාරණය | ආයතනය | | | |
|---|---|---|---|---|
| | මල්ටි වෙලඩර්ස්, මිරිස්වත්ත, බළන්ගොඩ. | කිත්මිණි අයන් වර්ක්ස්, දෙහිගස්තලාව, බළන්ගොඩ. | යුනයිටඩ් අයන් වර්ක්ස්, බලගහමුල, බළන්ගොඩ. | ටෙක්සිකා වෙල්ඩර්ස්, පරණ පාර, බළන්ගොඩ. |
| බළන්ගොඩ මොහාන් සාලිය එල්ලාවල මාවත මධ්‍ය තීරය මල් සිටුවීම පිණිස කොන්ක්‍රීට් බඳුන් ඉදිකිරීම් වැරගැන්නු සඳහා ශක්තිකරණ පාස්සා සැපයීම - (බඳුන් 100ක් සඳහා)<br><br>කම්බි කූඩු 01 සඳහා | රු. 2,850.00 | රු. 2,600.00 | රු. 2,950.00 | රු. 3,000.00 |

ඉහත මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතනයන් අතරින් රු. 2,600.00ක් වන අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති බළන්ගොඩ, දෙහිගස්තලාව, කිත්මිණි අයන් වර්ක්ස් ආයතනයේ මිල ගණන් පිළිගැනීමටත්, එම ආයතනයෙන් අදාල සේවාව ඉටු කර ගැනීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

2014 වර්ෂය සඳහා පොදුවෙළඳසැල මස්කඩ, මාළු කඩ අංක 14, විවෘත කඩ අංක 06, බළන්ගොඩ නගරයේ රථවාහන නැවතුම්ගාස්තු, බළන්ගොඩ නගරයේ කැළිකසළ එකතු කිරීම, බස් නැවතුම්පොල හා මහජන පොල වැසිකිළි නඩත්තු කිරීම හා මුදල් අය කිරීම සඳහා වන ලංසු විවෘත කිරීම සඳහා මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## කාරක සභා අවස්ථාව

### 09:03 2014 වර්ෂය සඳහා පොදුවෙළඳසැල අංක 14 මාළු කඩය ලංසු විවෘත කිරීම

2014 වර්ෂය සඳහා පොදුවෙළඳසැල අංක 14 මාළු කඩය සඳහා කිසිවකුත් ලංසු ඉදිරිපත් කර නොතිබුණි.

### 09:04 2014 වර්ෂය සඳහා පොදුවෙළඳසැල අංක 15 එළු මස් කඩය ලංසු විවෘත කිරීම

2014 වර්ෂය සඳහා පොදුවෙළඳසැල අංක 15 එළුමස් කඩය සඳහා පහත පරිදි ලංසු ඉදිරිපත් කර තිබුණි.

| අනු අංකය | නම සහ ලිපිනය | මුදල |
|---|---|---|
| 01. | දින් මොහොමදු මොහොමදු දරුක් මයා, අංක 06, මහවත්ත, බළන්ගොඩ. | රු. 75,700.00 |
| 02. | මොහොමඩ් රමීස් මොහොමඩ් රියාස්, අංක 258, මිරිස්වත්ත, බළන්ගොඩ. | රු. 75,650.00 |

ප්‍රසම්පාදන මණ්ඩය විසින් අදාල ලංසු පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉහත ලංසුකරුවන් අතරින් උපරිමය වන රු. 75,700.00ක ලංසුව ඉදිරිපත් කර තිබූ බළන්ගොඩ, මහවත්ත, අංක 06, දරන ස්ථානයේ දින් මොහොමදු මොහොමදු දරුක් යන අය වෙත 2014 වර්ෂය සඳහා

පොදුවෙළඳපොල අංක 15 දරන එළුමස් කඩය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ප්‍රසම්පාදන කාරක සභාවේ ඒකමතිකව සම්මත විය.

**09:05 2014 වර්ෂය සඳහා පොදු වෙළඳසැල අංක 16 හරක් මස් කඩය ලංසු විවෘත කිරීම**

2014 වර්ෂය සඳහා පොදුවෙළඳසැල අංක 16 හරක් මස් කඩය සඳහා පහත පරිදි ලංසු ඉදිරිපත් කර තිබුණි.

| අනු අංකය | නම සහ ලිපිනය | මුදල |
|---|---|---|
| 01. | දින් මොහොමදු මොහොමදු දරුක් මයා, අංක 06, මහවත්ත, බලන්ගොඩ. | රු. 1,500,700.00 |
| 02. | මොහොමඩ් රමීස් මොහොමඩ් රියාස්, අංක 258, මිරිස්වත්ත, බලන්ගොඩ. | රු. 1,500,900.00 |

ප්‍රසම්පාදන මණ්ඩය විසින් අදාල ලංසු පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉහත ලංසුකරුවන් අතරින් උපරිමය වන රු. රු. 1,500,900.00 ක ලංසුව ඉදිරිපත් කර තිබූ බලන්ගොඩ, මිරිස්වත්ත, අංක 258, දරන ස්ථානයේ දින් මොහොමදු මොහොමදු දරුක් මයා අය වෙත 2014 වර්ෂය සඳහා පොදුවෙළඳපොල අංක 16 දරණ හරක්මස් කඩය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ප්‍රසම්පාදන කාරක සභාවේ බහුතර ඡන්දයෙන් සම්මත විය.

**09:06 2014 වර්ෂය සඳහා පොදුවෙළඳසැල අංක 17 කුකුළු මස් කඩය ලංසු විවෘත කිරීම**

2014 වර්ෂය සඳහා පොදුවෙළඳසැල අංක 17 කුකුළු මස් කඩය සඳහා පහත පරිදි ලංසු ඉදිරිපත් කර තිබුණි.

| අනු අංකය | නම සහ ලිපිනය | මුදල |
|---|---|---|
| 01. | ෆලීල් මොහොමඩ් රවුෂාන් මයා, අංක 260, කල්තොට පාර, මිරිස්වත්ත | රු. 10,000.00 |

ප්‍රසම්පාදන මණ්ඩය විසින් අදාල ලංසු පරීක්ෂා කිරීමෙන් අනතුරුව මෙම සභාව විසින් ඉදිරිපත් කර තිබූ රු. 26,716.00ක මුදලට වඩා අඩුවෙන් එනම් රු. 10,000.00ක ලංසු මුදල බලන්ගොඩ, මිරිස්වත්ත, අංක 258, දරන ස්ථානයේ දින් මොහොමදු මොහොමදු දරුක් මයා අය විසින් ඉදිරිපත් කර තිබූ අතර, නගරයේ වෙනත් වෙළඳසැල් වල ද කුකුළු මස් වෙළඳාමට තැබීමෙන් මෙම කඩයේ අලෙවිය අඩුවීම හේතුවෙන් අඩු ලංසු මුදලක් ඉදිරිපත් වීම සිදු කර ඇති බැවින් එම අය වෙත 2014 වර්ෂය සඳහා පොදුවෙළඳපොල අංක 17 දරණ කුකුළු මස් කඩය රු. 15,000.00 බැගින් ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ප්‍රසම්පාදන කාරක සභාවේ ඒකමතිකව සම්මත විය.

**09:07 2014 වර්ෂය සඳහා විවෘත කඩ අංක 06 ලංසු විවෘත කිරීම**

2014 වර්ෂය සඳහා විවෘත කඩ අංක 06 සඳහා පහත පරිදි ලංසු ඉදිරිපත් කර තිබුණි.

| අනු අංකය | නම සහ ලිපිනය | මුදල |
|---|---|---|
| 01. | නුවන් දේශාන් ගුණතුංග, 23/30 ඒ, මහමෙව්නා මාවත, බළන්ගොඩ. | රු. 189,360.00 |
| 02. | නන්දන ප්‍රේමකුමාර ජයතුංග | රු. 138,600.00 |

ප්‍රසම්පාදන මණ්ඩය විසින් අදාල ලංසු පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉහත ලංසුකරුවන් අතරින් උපරිමය වන රු. 189,360.00ක ලංසුව ඉදිරිපත් කර තිබූ බළන්ගොඩ, මහමෙව්නා මාවත, අංක 23/30 ඒ දරන ස්ථානයේ පදිංචි නුවන් දේශාන් ගුණතුංග යන අය වෙත 2014 වර්ෂය සඳහා විවෘත කඩ අංක 06 දරණ කඩ කාමරය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ප්‍රසම්පාදන කාරක සභාවේ ඒකමතිකව සම්මත විය.

**09:08 2014 වර්ෂය සඳහා බළන්ගොඩ නගරයේ රථවාහන නැවතුම් ගාස්තු ලංසු විවෘත කිරීම**

2014 වර්ෂය සඳහා බළන්ගොඩ නගරයේ රථවාහන නැවතුම් ගාස්තු සඳහා පහත පරිදි ලංසු ඉදිරිපත් කර තිබුණි.

| අනු අංකය | නම සහ ලිපිනය | මුදල |
|---|---|---|
| 01. | තනූජා කුමාරි වීරපුර මිය, 38, සේනක පෙදෙස, බළන්ගොඩ. | රු. 87,750.00 |
| 02. | මිනෝර් කෞෂාන් ලියනආරච්චි මයා, රස නිවස, රත්නපුර පාර, බළන්ගොඩ. | රු. 87,550.00 |

ප්‍රසම්පාදන මණ්ඩලය විසින් අදාල ලංසු පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉහත ලංසුකරුවන් අතරින් උපරිමය වන රු. 87,750.00ක ලංසුව ඉදිරිපත් කර තිබූ බළන්ගොඩ, සේනක පෙදෙස, 38 දරන ස්ථානයේ පදිංචි තනූජා කුමාරි වීරපුර යන අය වෙත 2014 වර්ෂය සඳහා 2014 වර්ෂය සඳහා බළන්ගොඩ නගරයේ රථවාහන නැවතුම්ගාස්තු අය කිරීම ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ප්‍රසම්පාදන කාරක සභාවේ ඒකමතිකව සම්මත විය.

**09:09 2014 වර්ෂය සඳහා බළන්ගොඩ නගරයේ කැළිකසළ එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම**

2014 වර්ෂය සඳහා බළන්ගොඩ නගරයේ කැළිකසළ එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා පහත පරිදි ලංසු ඉදිරිපත් කර තිබුණි.

| අනු අංකය | නම සහ ලිපිනය | මුදල |
|---|---|---|
| 01. | බී. ගුණරත්න මයා, අංක 63/3, රාස්සගල පාර, බළන්ගොඩ | රු. 2,816,000.00 |

ප්‍රසම්පාදන මණ්ඩය විසින් අදාල ලංසු පරීක්ෂා කිරීමෙන් අනතුරුව රු. 2,816.000.00ක ලංසුව ඉදිරිපත් කර තිබූ බළන්ගොඩ, රාස්සගල පාර, අංක 63/3 දරන ස්ථානයේ පදිංචි බී. ගුණරත්න යන අය වෙත 2014 වර්ෂය සඳහා පොදුවෙළඳපොල අංක 15 දරන එළමස් කඩය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ප්‍රසම්පාදන කාරක සභාවේ ඒකමතිකව සම්මත විය.

**09:10 2014 වර්ෂය සඳහා බස් නැවතුම්පොල සහ මහජන පොල පොදු වැසිකිළි නඩත්තු කිරීම හා මුදල් අයකර පවත්වාගෙන යාම සඳහා ලංසු විවෘත කිරීම**

2014 වර්ෂය සඳහා විවෘත කඩ අංක 06 සඳහා පහත පරිදි ලංසු ඉදිරිපත් කර තිබුණි.

| අනු අංකය | නම සහ ලිපිනය | මුදල |
|---|---|---|
| 01. | බී. ගුණරත්න මයා, 63/3, රාස්සගල පාර, බළන්ගොඩ. | රු. 650,000.00 |

ප්‍රසම්පාදන මණ්ඩලය විසින් අදාල ලංසු පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉහත රු. 650,000.00ක ලංසුව ඉදිරිපත් කර තිබූ බළන්ගොඩ, රාස්සගල පාර, අංක 63/3 දරන ස්ථානයේ පදිංචි බී. ගුණරත්න යන අය වෙත 2014 වර්ෂය සඳහා බස් නැවතුම්පොල සහ මහජන පොල පොදු වැසිකිළි නඩත්තු කිරීම හා මුදල් අයකර පවත්වාගෙන යාම ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ප්‍රසම්පාදන කාරක සභාවේ ඒකමතිකව සම්මත විය.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

මෙවර මහා සභාවට යථාපරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි

## 11. යෝජනා

**11:01 ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

***11:01:01 මෙම සභාවේ කටයුතු සඳහා ඩබල් කැබ් රථයක් ලැබුණු හෙයින්, වෑන් රථය බළන්ගොඩ තානායම හා ඒකාබද්ධ කොට, රජයේ අනුමත ගාස්තු යටතේ කුලී රථයක් වශයෙන් යෙදවීම.***

මෙම සභාව වෙත පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යංශයෙන් ඩබල් කැබ් රථයක් ලැබුණු හෙයින්, වෑන් රථය කුලී රථයක් වශයෙන් යෙදවීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර නගර සභාවේ කටයුතු වලට එය යොදා නොගන්නා අවස්ථාවන්හි දී කුලී රථයක් වශයෙන් යෙදවීමට මහා සභාවේ සම්මත විය.

***11:01:02 නඩත්තුව සඳහා අධික වියදම් යන බැවින් කෲ කැබ්රථය සහ ටිපර් රථය වෙන්දේසි කිරීම***

නඩත්තු කටයුතු සඳහා දැඩි වියදමක් දැරීමට සිදුවන බැවින් කෲ කැබ් රථය සහ ටිපර් රථය වෙන්දේසි කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

***11:01:03 පොදු වෙළඳසැල පිටුපස පැරණි වැසිකිළිය ඉවත් කර අලුතින් වැසිකිළි පද්ධතියක් සෑදීම.***

පොදු වෙළඳසැල පිටුපස පැරණි වැසිකිළිය ඉවත් කර අලුතින් වැසිකිළි පද්ධතියක් සෑදීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

***11:01:04 පසුගිය මහා සභාවේ දී බලතල පැවරීම සම්බන්ධව ඉදිරිපත් කළ යෝජනාව සවිස්තරව කියවා ඉදිරිපත් කිරීම.***

පසුගිය මහා සභාවට ද ඉදිරිපත් කළ පරිදි නගර සභා ආඥා පනත යටතේ සභාපතිවරයා වෙත පැවරී ඇති බලතල, පළාත් පාලන ආයතනයන්හි කාර්ය සාධන නිර්ණායකයන්හි දැක්වෙන අන්දමට අදාල ධූරය දරන පුද්ගලයාගේ නමින් පැවරීම කළ යුතු බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට පැහැදිලි කරන ලද අතර, සභාපති ධූරයේ බලතල වීරසිංහ මුදියන්සේලාගේ නිමල් ගාමිණී වීරසිංහ වන තමාගේ නමින් පැවරීම සඳහා මහා සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

***11:01:05 ගෝ ඝාතකාගාරය නගර සභාව මගින් පාලනය කළ හැකි වන පරිදි පවරා ගැනීම හා ගවයින් ප්‍රදර්ශනය සම්බන්ධව ලිඛිතව ඉදිරිපත් කිරීම.***

ගෝ ඝාතකාගාරය නගර සභාව මගින් පාලනය කළ හැකි වන පරිදි පවරා ගැනීම හා ගවයින් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධව පැහැදිලි කරමින් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

***11:01:06 දැනට ඉරිදා දිනයේ පැවැත්වෙන සතිපොල සෙනසුරාදා දිනයේ පැවැත්වීම.***

දැනට ඉරිදා දිනයේ පැවැත්වෙන සතිපොල සෙනසුරාදා දිනයේ පැවැත්වීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ගරු උප සභාපතිතුමන්, ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර, එම්. නිමල් කරුණාරත්න, චමික ජයමිණි වැවේගෙදර යන නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා විසින් අදහස් දක්වන ලදී. නගරයේ වෙළෙන්දන් ආරක්ෂා කර ගැනීමට, අලුත් එළවලු ජනතාවට ලබා ගැනීමට සහ එයින් සභාවේ ආදායම ඉහල නංවා ගැනීමට මෙම යෝජනාව සිදුකරන ලද බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලද අතර, එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

***11:01:07 ඉරිදා දිනය කම්කරු නිවාඩු දිනයක් බවට ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම***

ඉරිදා දිනයේ කම්කරු නිවාඩු දිනයක් බවට ව්‍යාපාරිකයන් සහ කම්කරු කොමසාරිස් සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

***11:01:08 කර්මාන්ත කමිටුවේ දී තීරණය වූ පරිදි අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම.***

පසුගිය කර්මාන්ත කමිටුවේ දී ද තීරණය වී ඇති පරිදි අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

***11:01:09 තානායම පැතිබැම්ම සාදා උද්‍යාන අලංකරණය කිරීම***

තානායමේ පැතිබැම්ම සාදා උද්‍යාන අලංකරණය කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:01:10 කිරිඳිගල තොසිල ගාඩ්න්ස් හි බිම් කොටස බිම් කට්ටි කැබලි කර විකිණීම**

මේ සම්බන්ධව සභාවට ලැබී ඇති ලිපි, පෙත්සම්, පැමිණිලි, ආදිය ඉදිරිපත් කිරීම යටතේ තීරණයක් ගන්නා ලදී.

**11:01:11 ක්‍රීඩා කණ්ඩායම සහ අනෙකුත් අයහට එකම ඇඳුමක් ලබා දීම. (මුදල් අයකර හෝ නොකර)**

බළන්ගොඩ නගර සභාවේ ක්‍රීඩා සමාජයේ සාමාජිකයන්ට ඇඳුම් ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර ඒ සම්බන්ධව පහත පරිදි නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා විසින් අදහස් දක්වන ලදී.

***නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා***

*එම යෝජනාවට මම විරුද්ධයි. මේකට විශාල මුදලක් වැය වනවා. ක්‍රීඩා කරන අය අවශ්‍ය දේ මිල දී ගනී. සභාවට ලැබෙන මුදල් මාර්ග සංවර්ධනයට හෝ ආදායමක් ලැබෙන දේකට යොදවන්න.*

***නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා***

*මේවා අවශ්‍ය අය හඳුනාගෙන ලැයිස්තුවක් සකස් කර ඒවා අවශ්‍ය අයට පෞද්ගලිකව මිල දී ගැනීමට දැනුම් දීම සුදුසුයි.*

***නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා***

*සභාවේ මුදලින් මිල දී ගන්නවාට විරුද්ධයි.*

***ගරු උප සභාපතිතුමා***

*පසුගිය ක්‍රිකට් තරගාවලියේ දී නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් හොඳම පන්දු යවන්නා බවට පත් වුනා. ඒ සම්බන්ධව සතුටට පත් වනවා. එතුමන් කුඩා කාලයේ සිට ක්‍රීඩා තරග වල දී හඳුනනවා.*

*ක්‍රීඩාවේ පරමාර්ථය කෙසේ හෝ ජය ගැනීම නොවෙයි. නගර සභාව යනු ආයතනයක්. ජාතික මට්ටමේ අය මෙහෙ නෑ. එය සුහදතාවය පිණිසයි ඇත්තේ. ජයග්‍රහණය පිණිස පමණක් තරග වදිනවා නම් එය ක්‍රීඩාව*

*නොවෙයි. ආයතනයේ ඇති සම්පත් භාවිත කර ක්‍රීඩා කළ යුතුයි. ක්‍රීඩාව කිරීමට ගොස් මත බේද ඇති වී කණ්ඩායම බෙදෙනවා නම් එහි ක්‍රීඩාව සාර්ථක වී නෑ.*

***නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා***

*මා ක්‍රීඩා ගුරුවරයකු වශයෙන් සේවය කරනවා. ක්‍රීඩාවේ ජයග්‍රහණයට වඩා සහභාගීත්වයයි ඉතාම වැදගත්. සියළුම ආයතනයන්හි බඳවා ගැනීමේ දී ක්‍රීඩා කුසලතාවයට මුල්තැනක් දෙනවා. නගර සභාව කියන්නේ ඡන්දයෙන් පත් වී සේවය කිරීමට පත්වීම සත්‍යයක්. අප සේවය කරන ස්ථානයේ නම ඔසවා තැබීම අපගේ යුතුකමක්. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ලෝක කුසලානය දිනන තෙක් අප රට ගැන ලෝකය දැන සිටියේ නෑ. සියළුම ආයතනයන්ට ක්‍රීඩා සමාජයක් තිබිය යුතු යැයි සිතනවා. අපගේ සහභාගීත්වය තුළින් බළන්ගොඩ නගර සභාවේ නාමය ඉහලට ගෙන යා හැකියි. බළන්ගොඩ නගර සභාව අලංකාරයෙන් සහ සංවර්ධනයෙන් ඉදිරියෙන් තිබෙන අයුරින්ම ක්‍රීඩාවෙන් ද ඉහලට යාම අවශ්‍යයි. ක්‍රීඩා කණ්ඩායම් හඳුනාගෙන තිබෙනවා නම් ඔවුන් සඳහා නගර සභාවේ වියදමෙන් ඇඳුම් කට්ටල ලබා ගැනීම වරදක් නොවේ. එයින් ඉහලට එසවෙන්නේ බළන්ගොඩ නගර සභාවේ නාමයයි.*

***ගරු සභාපතිතුමා***

*නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා මෙයට විරුද්ධ නම් සභාපති අරමුදලෙන් හෝ මගේ පෞද්ගලික වියදමෙන් නගර සභාවේ සියළුම දෙනාට මේ ක්‍රීඩා ඇඳුම් ලබා දෙනවා.*

**11:02 නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

11:01:01 කිරිඳිගල, අනඳමෙත්ගම, ශෛලතලාරාම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම

11:02:02 ශෛලතලාරාම මාර්ගයේ පංසල දක්වා කොටසේ වීදි පහන් 04ක් සවි කිරීම

11:02:03 කිරිඳිගල වැලිහරණාව පාර ප්‍රතිසංස්කරණය කිරීම

11:02:04 මුගුණමලේ ඉත්තෑගලහේන මාර්ගය සංවර්ධනය කිරීම

11:02:05 නගර සභා කාර්යාලය සඳහා අලුතින් බඳවාගත් අයගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම්, බඳවා ගැනීමේ පටිපාටිය හා කාර්ය භාරය පැහැදිලි කිරීම

11:02:06 මුගුණමලය පාර බණ්ඩාරවත්ත හංදිය දක්වා කුණු එකතු කිරීම සඳහා ට්‍රැක්ටර් රථය යෙදවීම

නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාවන්ට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාවන් නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද 11:02:05 යෝජනාවට අදාල පැහැදිලි කිරීම් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම යෝජනා මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:03 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

11:03:01 ශ්‍රී සුනන්දාරාම වටරවුම් මාර්ගය තාර දමා අලුත්වැඩියා කිරීම (බළන්ගොඩ)

11:03:02 සුදර්ශනගම මාර්ගය තාර දමා අලුත්වැඩියා කිරීම

ගරු උප සභාපතිතුමන් විසින් ඉදිරිපත් කර ඇති ඉහත යෝජනාවන්ට අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒවා මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:04 නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා**

11:04:01 කුමාරගම පංසල අසළ මාර්ගය ඉතා අබලන් වී ඇති බැවින් සංවර්ධනය කිරීම

11:04:02 දුණුමඩලගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීම

නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාවන්ට මහා සභා අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාවන් නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒවා මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:05 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

11:05:01 දෙවට පාරේ වීදි පහන් හතරක් සවි කිරීම

11:04:02 නගරය තුළ ඇති නිවාස වලට යන මාවත් අංක වලින් නම් කිරීම

නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ඉදිරිපත් කර ඇති පරිදි, දෙවට පාරේ වීදි පහන් හතරක් සවි කිරීමටත්, නගරයේ මාවත් වල ඇති අතුරු මාර්ග පළමු පටුමග, දෙවන පටුමග ආදී වශයෙන් අංක වලින් නම් කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාවන් නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 12. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

**12:01 පුස්තකාල උපදේශක කමිටුවේ අනු කමිටු රැස්වීම් වාර්තාව**

2013.11.11 වන දින පැවති පුස්තකාල උපදේශක කමිටුවේ අනුකමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:01 කර්මාන්ත හා සංවර්ධන කාරක සභා වාර්තාව**

2013.11.19 වන දින පැවති කර්මාන්ත හා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී. එමෙන්ම එහි වෙනත් කරුණු යටතේ යෝජනා වූ පරිදි මෙම සභාවේ ගල්රෝල සහා කර්මාන්ත වලට අමතරව කොන්ත්‍රාත්පදනම මත සභාවට අයත් කර්මාන්තයන් ඉටුකරන්නන් වෙතින් දිනකට රු. 3,000.00ක් සහ ගල්රෝල ක්‍රියාකරු වෙත ගෙවන මුදල අය කර ගැනීමට ද යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:03 මුදල් කාරක සභා වාර්තාව**

2013.11.20 වන දින පැවති මුදල් කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:04 සෞඛ්‍ය, සන අපද්‍රව්‍ය හා උපදේශන කාරක සභා වාර්තාව**

2013.11.20 වන දින පැවති සෞඛ්‍ය, සන අපද්‍රව්‍ය හා උපදේශන කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:01 ආපදා කළමනාකරණ කාරක සභා වාර්තාව**

2013.11.20 වන දින පැවති ආපදා කළමනාකරණ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මයහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම

2013 ඔක්තෝබර් මාසය සඳහා වන ලැබීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 5,417,634.33 |
| වෙනත් ලැබීම් | 1,431,034.83 |
| **මුළු ලැබීම්** | **6,431,034.83** |
| පුනරාවර්තන වියදම් | 6,306,813.90 |
| වෙනත් වියදම් | 1,590,540.30 |
| **මුළු වියදම්** | **7,897,354.94** |

- බලන්ගොඩ තානායමේ 2013.10.01 වන දින සිට 2013.10.31 වන දිනයෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම ද එතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉහත වාර්තාවන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනා වගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:02 2013.10.01 සිට 2013.10.30 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව**

2013.10.01 සිට 2013.10.30 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 542,155.80 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වැය මාරුව ඉදිරිපත් කිරීම

2013 වර්ෂයේ ප්‍රතිපාදන ඉතිරි වැය ශීර්ෂයන් වෙතින් ප්‍රතිපාදන අවශ්‍ය වැය ශීර්ෂයන් වෙත සිදුකරන වැය මාරුව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 15. 2014 අයවැය කෙටුම්පත ඉදිරිපත් කිරීම

2014 වර්ෂය සඳහා වන බළන්ගොඩ නගර සභාවේ අයවැය කෙටුම්පත ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, එයට මහා සභාවේ අනුමැතිය ලබා දීමමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

2014 අයවැය ප්‍රකාශයට අදාලව නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා විසින් පහත පරිදි අදහස් ඉදිරිපත් කරන ලදී.

***නගර සභා ගරු මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා***

*2012 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන වලින් මෝටරය සමග ලබා දුන් ස්ටාර්ටරය වෙළඳසැලෙන් ලබා දී තිබුණත් එය සභාවේ දී නැති වී තිබෙනවා. එවන් තත්ත්වයක් මත මෙවර 2013 අයවැය සඳහා මුස්ලිම් පල්ලියකට සහ බලගහමුල සමිතියකට හට් දෙකක් යෝජනා කළා. එම හට් දෙකම සභාවට ගෙන ආවා. එය අද 9.00ට එය ලබා ගැනීමට ඔවුන්ට ආරාධනා කිරීමෙන් මා බොරුකාරයකු බවට පත් වුනා. මෙවන් අකටයුතුකම් නැවත සිදු නොවීමට පක්ෂයක් වශයෙන් මෙවර අයවැයට මගේ විරුද්ධතාවය ප්‍රකාශ කරනවා.*

*ගරු සභාපතිතුමා විසින් ඒ සඳහා මෙසේ පිළිතුරු ලබා දෙන ලදී.*

*දොරවෙලට හට් එකට අමතරව වලං දුන්නා. හට් එක සාදා අවසන් නම් එය ගෙන ඒමට මා කීවා. එය ලබා දෙන විට සභාවෙන් දෙන ආකාරයට දිය යුතුයි. ඔබතුමාගේ පෞද්ගලික පරිත්‍යාගයක් වශයෙන් නොවෙයි. හරියට බලනව නම් ජල මෝටරය දිය යුතු නෑ. අනවසර ඉදිකිරීමක් වුවත් ගරු උප සභාපතිතුමන්ගේ සහ ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමාගේ ඉල්ලීම අනුව ජලය ලබා දිය යුතු නිසා දුන්නේ. ඔවුන්ට මෝටරය සමඟ ස්ටාර්ටරය ලබා දුන්නත්, නැවත මෝටරය ගෙන ඒමේ දී ස්ටාර්ටරය නැවත සභාවට එවා තිබුණේ නෑ. එය අදාල සමිතියෙන් විමසීම කළ යුතුයි. මෙම සභාවේ දී මා වෙතින් කිසිවකුටත් අසාධාරණයක් සිදු වී නෑ. පසුගිය වර ලබා දුන් රු. 2000,000.00ක මුදලින් එක් නගර සභා ගරු මන්ත්‍රීතුමකුගෙන් රු. 50,000.00 බැගින් ලබාගෙන මහජන පොල කඩකාමර සෑදුවා. එම 50,000.00ක මුදල නිමල් කරුණාරත්න, ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර යන නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ලබා දුන්නා. නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් ද ඉල්ලා තිබෙනවා. අනෙකුත් නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ද එය ලබා දෙනවා.*

***නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා***

*පුවත්පත් කලාවේදීන්ගෙන් ඉල්ලා සිටිනවා ප්‍රදේශවාසීන්ගේ දැනගැනීම සඳහා නියමාකාරව සටහන් කර ගන්නා ලෙස. ඡන්දයෙන් අප වත් වූ පසු අයවැයකින් ලබා දුන් මුදල් හැර, අප මහා සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාවකින් සිදුකිරීමට හැකි වූ කාර්යයක් නෑ. ඒ සඳහා ප්‍රමුඛතාවය ලබා දී නෑ. ආණ්ඩු පක්ෂයේ නගර සභා ගරු මන්ත්‍රීවරයකු ඒ සමාන යෝජනාවක් කළහොත් පමණයි සම්මත වී සිදු කරන්නෙ. සමාජයෙන් අපට චෝදනාවක් තිබෙනවා. ගරු සභාපතිතුමන් සමඟ එකතු වී බෙදා හදාගෙන මහජන මුදල් ගසා කන බවට. අප සියළු දෙනා මහජන ඡන්දයෙන් තේරී පත්වී සිටින්නේ. නගරයේ ජනතාවට මා කියන්නට කැමතියි අප කිසිවකුත් ඒ සඳහා හවුල් වී නොමැති බවට. ප්‍රදේශයේ ජනතාව*

*කරන චෝදනාවන්ගෙන් අප නිදහස් කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලනවා. එවන් කාර්යයන්ට සම්බන්ධ වූ පුද්ගලයන් සිටිනවා නම් එය හඳුනා ගන්න යැයි ඉල්ලනවා. මේ හේතුවෙන් සහ අපට සිදු වූ මදිපුංචිකම් හේතුවෙන් මෙවර අයවැයට මා විරෝධතාව පළ කරනවා.*

***නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා***

*මා ගරු සභාපතිතුමන්ව අවුරුදු 20 - 25 ක කාලයක සිට ඇසුරු කරනවා. මා එතුමාගේ වරදක් කවරදාකවත් කියන්නේ නෑ. සභාපතිතුමන් මා හට උදව් කර තිබෙනවා. නමුත් මෙහි දී කිව යුතුයි, පසුගිය වසරේ අයවැයෙන් අසාධාරණයක් සිදුවුනා. කිහිප වරක් ඉතිරි රු. 50,000.00ක මුදල ලබා දුන්නේ නෑ. මෙවර අයවැයෙන් වෙන් කර ඇති රු. 250,000.00ක මුදල ලැබේ දැයි විශ්වාස නෑ. ගරු සභාපතිතුමන් මා යෝජනාවක් කළ විට එය නොකරන ලෙස පුද්ගලිකව චෝදනා කරනවා. කර්මාන්ත කමිටු ආදියට අප පැමිණ වැඩක් නෑ. අප කියන කිසිවක් සම්මත වන්නේ නෑ. මෙවර අයවැයට යෝජනා කිසිවක් ඉදිරිපත් නොකළේ එය සිදු කිරීමෙන් ඵලක් නොවන නිසා. මෙවර අයවැයට එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායම වශයෙන් එකමුතුව වැඩ කළ යුතු බැවින් මා හට විරුද්ධ වීමට සිදුවනවා.*

***නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා***

*විපක්ෂයේ නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් දැක්වීම් ගැන යමක් කිව යුතුයි. විපක්ෂය, ආණ්ඩු පක්ෂය යනුවෙන් නොසලකා සියළු දෙනාටම එක හා සමානව කටයුතු කළ එකම සභාපතිවරයා වර්තමාන ගරු සභාපතිතුමයි. ගියවර අවයැයෙන් වෙන් වූ රු. 200,000.00ක මුදලින් රු. 50,000.00ක් ලබා නොදුන් බවට චෝදනා කළා. ඔබතුමන්ලාට පමණක් නොවෙයි අපටත් ලබා දුන්නේ රු. 150,000.00ක් පමණයි. විපක්ෂයේ හැසිරීම එසේ වීම සාමාන්‍යයි. නගර සභාවට ඔබලාගෙන් තිදෙනෙකු ජනතාව විසින් පත්කර තිබෙනවා. ඔබ පක්ෂයෙන් බළන්ගොඩ ආසනයට පාර්ලිමේන්තු ගරු මන්ත්‍රීවරයකු ද සිටිනවා. බළන්ගොඩ ආසනයට සම සංවිධායකවරයකු ද සිටිනවා. අසංක විජයසිංහ මැතිතුමාගේ පියා පළාත් සභා ගරු මන්ත්‍රීවරයකු වශයෙන් ද, චමික වැවේගෙදර මැතිතුමන්ගේ පියා මෙම නගර සභාවේ සභාපතිවරයකු වශයෙන් ද කටයුතු කර තිබෙනවා. ඒ කාලය තුළ දී බළන්ගොඩ නාගරික ජනතාවට අවශ්‍ය සංවර්ධනය ලබා දීමට නොහැකි වීම නිසයි අද විපක්ෂයට පත් කර තිබෙන්නේ. මෙම ප්‍රදේශයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හරහා විශාල සංවර්ධනයක් සිදු කළ හැකියි. ඔබගේ පාර්ලිමේන්තු සහ පළාත් සභා ගරු මන්ත්‍රීතුමන්ලා වෙතින් මෙම ප්‍රදේශයට ලද මුදල් සහ ගරු සභාපතිතුමන් විසින් සභා අරමුදලෙන් වෙන් කරන ලද මුදල් වලින් සිදු වූ සේවවය සංසන්දනය කරන්න.*

*මෙම අයවැය ගරු සභාපතිතුමන් විසින් ඉතාමත් හොඳ ආකාරයෙන් ඉදිරිපත් කර තිබෙනවා. එම අයවැයට විරුද්ධ වනවා නම් එය හේතු සහිතව පෙන්වා දිය යුතුයි. මේ නගර සභාව බෙදා හදාගෙන සංවර්ධනය කිරීමට අප සියළු දෙනා එක්ව කටයුතු කර තිබෙනවා. එදා නගර සභාව විනාශ කළ විපක්ෂය අද චෝදනා කරන්නේ.*

*නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමා සුරංගනා කතාවක් කියන්නේ. සභාපතිතුමන්ට විරුද්ධ නැති නම් මෙතන සිටින්නේ වෙනත් කෙනෙක් ද? පක්ෂයේ තීරණයට අනුව අයවැයට විරුද්ධ වුනත් ඔබතුමාගේ හෘදය සාක්ෂියට අනුව අයවැයට පක්ෂයි. එයයි බුද්ධිමත් ජනතාව කල්පනා කළ යුත්තේ. ගරු සභාපතිතුමන් ගැන විශ්වාසයක් නැති බව පවසනවා නම්, 2013 වර්ෂයේ අයවැයෙන් රු. 150,000.00ක් ලබා*

*දුන්නේ කවුදැයි මා විමසනවා. පක්ෂ බේදයකින් තොරව ඔබතුමන්ලාගේ ඉල්ලීම් ඉටු කළේ ආණ්ඩු පක්ෂයයි. පසුගිය එක්සත් ජාතික පක්ෂ පාලන කාලය තුළ කිසිදු මුදලක් අපගේ පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට ලබා දුන්නේ නෑ. ඔවුන් රජයෙන් ලැබෙන ප්‍රතිපාදන වලින් නගරයට සංවර්ධන කාර්යයන් ලබා දුන්නේ. විශ්වාසයක් නැති අය සමඟ වැඩ කිරීම අපහසුයි.*

*ගරු සභාපතිතුමා දක්ෂ නායකයෙක්. අප අතර මතබේද, විවාද, ගැටුම් ආදිය ඇති වීමට හැකියි. එය නිමල් ගාමිණී වීරසිංහ යන පුද්ගලයා සමග ගැටුමක් වැඩක් නෑ. මෙම නගර සභාවේ ගරු සභාපතිතුමන් සමඟයි අපට මනාප ලබා දී තිබෙන්නේ. එබැවින් මෙවර අයවැයට මගේ කැමැත්ත ලබා දෙනවා.*

***නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා***

*විපක්ෂයේ අදහස් දැක්වීම් සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරනවා. පක්ෂ බේදයකින් තොරව මෙවර අයවැයෙනුත් රු. 250,000.00ක ප්‍රතිපාදන වෙන් කර තිබිය දීත් සේ ප්‍රකාශ කිරීම නුසුදුසුයි. පසුගිය වර්ෂයේ ඉතිරි මුදලින් අප ගම්මානයේ වෙල්යායේ වේල්ල ප්‍රතිසංස්කරණයට මුදල් ලබා දුන්නා. 2014 වර්ෂයේ අයවැය සඳහා මාගේ ඡන්දය ප්‍රකාශ කරනවා.*

***නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා***

*2014 අයවැය සම්බන්ධව ආපසු හැරී බැලීමක් කළ යුතුයි. බළන්ගොඩ නගරයේ පසුගිය වසර ගණනාවක කාලය තුළ විශාල සංවර්ධනයක් සිදුකර තිබෙනවා. ඒ සඳහා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන්, හිටපු ජනාධිපතිනී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය, මධ්‍යම රජයේ සහ පළාත් සභාවේ මැති ඇමතිවරු සහ හිටපු ගරු ආණ්ඩුකාරවර මොහාන් සාලිය එල්ලාවල මැතිතුමා ඇතුළු බොහෝ දෙනෙකු සහය දී තිබෙනවා. ඒ අනුවයි බළන්ගොඩ නගර සභාව අද මේ තත්ත්වයට දියුණු වූයේ. හැමදාම අපට නගර සභාව දිනා ගැනීමට හැකිව තිබෙන්නේ එබැවින්. ආණ්ඩු පක්ෂයේ මෙන්ම විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා එකා මෙන් වැඩ කළා. ලේකම්තුමිය ඇතුළු නිලධාරීන් සහ සේවක මණ්ඩලය ඒ සඳහා විශාල කැපවීමක් කළා. ඔවුන්ටත් ගෞරවනීය ස්තුතිය පළ කරනවා.*

*නගර සභාවේ අරමුදලින් අපට ලැබුණෙත් ගරු විපක්ෂ මන්ත්‍රීතුමන්ලාට ලැබුණු ප්‍රමාණයමයි. ගරු සභාපතිතුමන් අපට විශේෂ සැලකිල්ලක් දක්වන්නේ නෑ. ඔබතුමන්ලාගේ පක්ෂයේ තීරණයක් අනුව අයවැයට විරුද්ධ වුනත් හෘදය සාක්ෂියට අනුව පක්ෂ බව දන්නවා. වසර 04කට අපව පත් කර එවූ ජනතාවට සේවය කළ යුතුයි. මා නගර සභාවේ 2014 අයවැයට සහයෝගය දක්වනවා.*

***නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා***

*මෙවර අයවැය ඉදිරිපත් කළ සභාවාරය දීර්ඝ වේලාවක් පැවතියා. මා විශාල අවදානමක සිටියේ. ගම නැගුම ව්‍යාපෘතියේ 'එක් ගමකට එක් වැඩක්' වැඩසටහන යටතේ රු. 1,000,000.00ක මුදලක් ළමා උද්‍යානයට වෙන්වුනා. ඒ සඳහා ව්‍යාපාරිකයන්ගේ සහයෝගය ලබා ගැනීමට සිදුවුනා. රාජ්‍ය ආයතන ඇතුළු අනුග්‍රාහකයන්ගේ සහය ලැබුණා. එහි මේ වන විට උද්‍යාන අලංකරණය සිදුවෙමින් පවතිනවා. අප නිතරම හැප්පිලි සමඟින් ගමන යන්නේ.*

*ගරු සභාපතිතුමන් ඉතා දක්ෂයි. තව කෙනෙක්ට ඇහුම්කන් දීම ඉතාඅඩුයි. අද අයවැයෙන් රු. ලක්ෂ 2.5ක මුදලක් වෙන් කර තිබෙනවා. මෙයට කිසිවකුගෙන් මුදල් නොඉල්ලීමට සිතාගෙන සිටින්නෙ. මා කිසිවකුට ගැත්තකු වන්නේ නෑ. මැතිවරණ කටයුතු සිදු කළෙත් මගේ පෞද්ගලික මුදලින්. මා අයවැයට ස්තුතිය පළ කරනවා.*

***ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා***

*මෙම සභාවේ වාර්තා කටයුතු සිදු කරන මාධ්‍යවේදීන්ගේ දීමනාව වැඩි කිරීමට පළමුව ඉල්ලා සිටිනවා. සභාපතිවරයා හිතුවක්කාර වැඩ කරනවා නම් ඔහු වටේ සිටින අප එය පෙන්වා දිය යුතුයි. අපි හැමදාම දිනන්න කැමතියි. මා උප සභාපති වීමට උත්සාහ කළා. ගරු සභාපතිතුමාගේ ඡන්ද පදනම 2011 මැතිවරණයෙන් අඩුවුනා. ඒ අප කියන දේ නොඇසූ නිසයි. අප ඔබතුමන්ට අවංකව ආදරෙයි. මා හට බැන්නත් එය ඉවසාගෙන සිටියා. ඔබතුමන්ට අපහසුකාරී අවස්ථා පැමිණි විට මා උදව් කර තිබෙනවා.*

*මා අද පැමිණියේ මෙම අයවැය පරාජය කිරීමටයි. නමුත් සභාපතිතුමන් විවේක කාලයේ දී කරට අත දමා ඉදිරියට වැරදි සිදු නොවන බව පවසා සමාව ඉල්ලුවා. මා මෙහි පැමිණියේ ඕනෑම අවස්ථාවකට මුහුණ දීමටයි. මා යුක්තිගරුකව සාධාරණව කතා කරන කෙනෙක්. මා මෙවර අයවැයට පක්ෂව ඡන්දය ප්‍රකාශ  කරනවා.*

ඉහත අදහස් දැක්වීම් සලකා අයවැය කෙටුම්පතට අනුමැතිය ලබා ගැනීම සඳහා ඡන්ද විමසීමක් සිදු කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එය නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, මහා සභාවේ ඒකමතිකව සම්මත වීමෙන් අනතුරුව ඡන්ද විමසීම සිදු කරන ලදී.

පහත දැක්වෙන නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා විසින් 2014 අයවැය කෙටුම්පතට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී.  වීරසිංහ මැතිතුමා
2. ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා
3. නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා
4. නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
5. නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා
6. නගර සභා ගරු මන්ත්‍රී එම්.  නිමල් කරුණාරත්න මැතිතුමා

2014 අයවැය කෙටුම්පතට පහත දැක්වෙන නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා විසින් විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

1. නගර සභා ගරු මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා
2. නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා
3. නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා

2014 අයවැය කෙටුම්පත නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාගේ බහුතර ඡන්දයෙන් මහා සභාවේ සම්මත විය.

## 14. වෙනත් කරුණු

### 14:01 නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා

66 වන උපන් දිනය සමරන අතිගරු ජනාධිපතිතුමන්ට බළන්ගොඩ නගරයේ වැසියන් වෙනුවෙන් සුභපතන බවත්, පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුව හරහා විදේශ රාජ්‍ය නායකයින් විශාල ප්‍රමාණයක් පැමිණි බවත්, රටේ පවතින සාමය විදේශ නායකයන් අවබෝධ කරගත් බවත් නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් මහා සභාවට ප්‍රකාශ කරන ලදී. එමෙන්ම එතුමන්ට දීර්ඝ කාලයක් රට පාලනය කිරීමට හැකි වේවා යි ප්‍රාර්ථනා කරන බව ද ගරු මන්ත්‍රීතුමන් සඳහන් කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමාගේ උත්සාහයෙන් ළමා උද්‍යානය ඉදිකිරීම සම්බන්ධව සුභ පතන  බවත්, මෙම නගර සභාවට කැබ් රථයක් ලබා දීම

සම්බන්ධව පළාත් පාලන සහ පළාත් සභා ගරු අමාත්‍ය ඒ. එල්. එම්. අතාඋල්ලා මැතිතුමන්ට ස්තුතිය පළ කරන බවත් එතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

**14:02 නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා**

ඕළුගංතොට රෝහල අසළ විශාල මාර ගසක තිබෙන දිරා ඇති අත්තක් හේතුවෙන් අනතුරුදායක තත්ත්වයක් ඇතිවී ඇති බැවින් කපා ඉවත් කළ යුතු බව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් මහා සභාවට ප්‍රකාශ කරන ලදී.

## 15. අවසානය

**ගරු සභාපති එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමන් සභාව අමතමින්, තමන් පාලක පක්ෂයේ වසර 12ක් අයවැය ඉදිරිපත් කරන ලද අතර, වසර 10ක් විපක්ෂයේ සිටිමින් අයවැය ඉදිරිපත් කරනු දැක ඇති වුවත්, සභාවක නියම තත්ත්වය දැන ගැනීමට හැකිවූයේ මෙදින බව ද, වසර 22ක තම ජීවිත කාලයේ දී ලබා ගැනීමට නොහැකි වූ අත්දැකීමක් ලබා ගැනීමට හැකි වූ බව ද සඳහන් කරන ලදී. මෙම සභාව කිසි කළෙකවත් මෙවන් අයවැය සංවාදයක් සිදු කර නොමැති බව ද, ග්‍රාමීය ජනතාවට සමීපතම පළාත් පාලන ආයතනය කොට්ඨාස ක්‍රමයට පැවැත්වීමට අතිගරු ජනාධිපතිතුමන් කටයුතු කරන ලද බව ද, ගරු සභාපතිතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමාගේ ළමා උද්‍යානය සාදා නිම කිරීමේ ඉලක්කයට යාම සඳහා මුද්දර ගාස්තු වලින් ප්‍රතිපාදන වෙන් කරන බවත්, නගර සභා ගරු මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ඉල්ලූ පරිදි ඕලුගංතොට මාරගසේ අත්ත කපා දැමීම ආපදා කළමනාකරණ ඒකකයට ලැබුණු උපාංග වලින් සිදු කළ හැකි බව ද ගරු සභාපතිතුමන් සඳහන් කරන ලදී.

ඉදිරි වර්ෂයක කාලය තුළ නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා සහ නිලධාරී මණ්ඩලය සමඟ එක්ව ජනතාවට විශිෂ්ට සංවර්ධනයක් ලබා දීමට බලාපොරොත්තු වන බව ද, 2013 වර්ෂය තුළ රුපියල් ලක්ෂ 352ක් වටිනා සංවර්ධනයක් සිදුකර තිබෙන බව ද, පංච ශීලය ආරක්ෂා කරමින් බළන්ගොඩ නගරය ඉදිරියට ගෙනයාමට කටයුතු කරන බව ද මෙදින මහා සභාවට සහභාගී වූ ගරු උප සභාපතිතුමා, නගර සභා මන්ත්‍රීතුමන්ලා, මාධ්‍යවේදීන් ඇතුළු සියළු දෙනාට ස්තුතිවන්ත වෙමින්, අයවැය ඉදිරිපත් කිරීම සැමරීම සඳහා බළන්ගොඩ තානායමේ දී පැවැත්වෙන ප්‍රිය සාදයට සහභාගී වන මෙන් නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා සහ ආයතනයේ අංශප්‍රධානීන් වෙත ආරාධනය කරමින් වර්ෂ 2013 නොවැම්බර් මාසයට අදාල මහා සභා රැස්වීම ප.ව. 6.15ට පමණ ගරු සභාපතිතුමන් විසින් අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.